# 06 ශ්‍රේණිය-විද්‍යාව

# වැඩ පොත

## (නාලන්ද විද්‍යාලීය ව්‍යාපාතිය)



**(සියලුම ඒකක ආවරණය වන ලෙස සැකසූ ඒකක පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර 11 කින් සමන්විතය)**

**හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | විද්‍යාව | ඒකකය : 1 - ජෛව ගෝලයේ අසිරිය |
|---|---|---|

- වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) සියලුම ජීවීන්ට පොදු ජීව ක්‍රියාවකි.
1) ශ්වසනය 2) වර්ධනය 3) ප්‍රජනනය 4) ඉහත සියල්ලම

(2) සංචරණය කල නොමැකි සත්වයෙකි,
1) මුහුදු වල 2) පැස්බරා 3) පෙන්ගුයින් 4) ජෙලි ෆිෂ්

(3) ශාක චලන වලට උදාහරණයක් නොවන්නේ,
1) නිදිකුම්බා ශාක පත්‍ර අතින් ඇල්லු විට හැකිලීම.
2) සවස් කාලයේ දී කතුරුමුරුංගා පත්‍ර හැකිලීම.
3) සවස් කාලයේ දී සියඹලා පත්‍ර හැකිලීම.
4) සවස් කාලයේ දී පේර පත්‍ර හැකිලීම.

(4) ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණයට යොදා ගත හැකි උපකරණයකි.
1) සංයුක්ත අන්වීක්ෂයකි 2) දුරේක්ෂය වේ
3) සරල අන්වීක්ෂය වේ 4) බහුරූපේක්ෂය වේ



(5) ශ්වසන චලන නිරීක්ෂණය කළ හැකි ජීවියෙකි.
1) අක්කපාන 2) බෝ 3) නිදිකුම්බා 4) මීයා

(6) අවර්ණ හුණුදියර මගින් හඳුනා ගන්නේ
1)ඔක්සිජන් 2) කාබන්ඩයොක්සයිඩ් 3) හයිඩ්‍රජන් 4)නයිට්‍රජන්

(7)වරහන් තුල දී ඇති වචන වලින් ගැලපෙන පිළිතුර තෝරා ලියන්න
අප සිරුර තුලට. ...................... ඇතුල්කිරීම ...................... ලෙසත්. ...................... පිටකිරීම .................. ලෙසත් හැදින්වේ. සතුන් තැනින් තැනට යෑම .................... ලෙස හැදින්වේ . ජීවීන් ප්‍රමාණයෙන් විශාලවීම .................... ලෙස හැදින්වේ. ...................... ශාක නිපදවන ආහාර මත සතුන් සෘජුවම හෝ වක්‍රව යැපීම සිදුවේ. එම සතුන් .................... ලෙස හැදින්වේ. සූර්ය ශක්තිය උපයෝගී කරගෙන ආහාර නිපදවීමේ ක්‍රියාවලිය .......................... ලෙස හැදින්වේ. නව ජීවීන් බිහිකිරීමේ ක්‍රියාවලිය ........................ නම්වේ. ජීවීන් සිය ආහාර අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලිය ........................ නම්වේ. .(ප්‍රභාසංස්ලේෂණය, පෝෂණය, ආශ්වාසය, සංචරනය, වර්ධනය, ප්‍රශ්වාසය, ඔක්සිජන්, විෂමපෝෂීන්, ප්‍රාජනනය, කාබන්ඩයොක්සයිඩ් )

(8) 1) ශාක හා සතුන් අතර වෙනස්කම් සංසන්දනය කරන්න.
2) ජීවීන් බෙදිය හැකි ප්‍රධාන කාණ්ඩ 3 නම් කරන්න.
3) ජීවීන්ගේ ලක්ෂණ 2 ක් ලියන්න.

4) පහත සඳහන් සතුන් හඳුනාගන්න.


A. ................................. B. ................................. C. .................................

(9)
1) ප්‍රභාසංස්ලේෂණය, ශ්වසනය, වර්ධනය යන පද හඳුන්වන්න.
2) ශාකයක වර්ධනය මනින උපකරණයේ නම කුමක් ද?
3) පිදුරු පල් කල ජලයේ හමුවන ක්ෂුද්‍ර ජීවීන්ගේ නම ලියන්න.
4) ක්ෂුද්‍ර ජීවීන්ගෙන් ඇති ප්‍රයෝජන 2 ක් ලියන්න.
5) ක්ෂුද්‍ර ජීවීන්ගෙන් සිදුවන හානි 2 ක් ලියන්න.

(10)
1) දෙබෙදුම් සුචියක් යන්න අර්ථ දක්වන්න.
2) දෙබෙදුම් සුචියක් මගින් පහත ශාක වර්ග කරන්න.
(බෝ, අක්කපාන, කතුරුමුරුංගා, නුග)
3) දෙබෙදුම් සුචියක් මගින් පහත සතුන් වර්ග කරන්න.
(ගිරවා, නයා, කැරපොත්තා, පිළිහුඩුවා)

(11) පහත දෙබෙදුම් සුචියේ හිස්තැන් පුරවන්න.

බෝ, කතුරුමුරුංගා, බෝගන්විලා, නිවිති

ශාක කඳෙහි කටු ඇති
(බෝගන්විලා)

ශාක කඳෙහි කටු නැති
(බෝ, කතුරුමුරුංගා, නිවිති)

.........................................
(බෝ)

.........................................
(කතුරුමුරුංගා, නිවිති)

පත්‍රය පත්‍රිකා ලෙස බෙදී ඇත.
(කතුරුමුරුංගා)

පත්‍රය පත්‍රිකා ලෙස බෙදී නැත.
.................................................

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය


**6 ශ්‍රේණිය** | **විද්‍යාව** | **ඒකකය : 2 - අප අවට ඇති දේ**

- වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) ස්කන්ධයක් සහිත, අවකාශයෙ ඉඩක් අත්කර ගන්නා දෑ හඳුන්වන්නේ,
1) පදාර්ථ 2) ශක්ති 3) අවකාශය 4) ඝන

(2) ඝන පදාර්ථ වලට,
1) නිශ්චිත හැඩයක් ඇත. 2) නිශ්චිත පරිමාවක් ඇත.
3) නිශ්චිත හැඩයක් හා පරිමාවක් ඇත. 4) නිශ්චිත ඝනත්වයක් ඇත.

(3) ද්‍රව පරිමාව මනින නිවැරදිව ඇස තබන මට්ටම,
1) A 2) B
3) C 3) A හෝ B




(4) හංගුරතාව දක්වන ද්‍රව්‍යකි.
1) රිදී 2) රන් 3) යකඩ 4) අඟුරු

(5) තන්‍යතාව දක්වන්නේ,
1) වීදුරු 2) අඟුරු 3) හුණු ගල් 4) තඹ

(6) පහත ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

a) පියරු සිනිඳු වයනයක් සහිත ද්‍රව්‍යයකි. ( )
b) රබර් ප්‍රත්‍යස්ථතා බවින් යුත් ද්‍රව්‍යයකි. ( )
c) තන්‍යතාවය යනු මිටියකින් තැලූ විට කුඩු බවට පත් නොවී තැලිය හැකි වීමයි. ( )
d) ආඝාතන්‍යතාව යනු ඇදීමට ලක් කළ විට නොකැඩී කම්බි බවට පත් කිරීමයි. ( )
e) දියමන්ති දෘඩ බවින් යුත් ද්‍රව්‍යයකි. ( )

(7) ඝන ද්‍රව වායු පදාර්ථ සන්සන්දනය කරන්න.


| ඝන | ද්‍රව | වායු |
|---|---|---|
| නිශ්චිත හැඩයක් ඇත. | a | b |
| නිශ්චිත පරිමාවක් ඇත. | c | d |

(8) I. ඉහත පරීක්ෂණයේ නිරීක්ෂණය ලියන්න.


..........................................................................................

II. නිගමනය ලියන්න.

..........................................................................................




(9) ශිෂ්‍යයන් කළ ක්‍රියාකාරකමක් පහත දැක්වේ.




I) ඉහත A බැලුනය සිදුරු කළ විට කුමක් සිදුවේද?
II) එම ක්‍රියාකාරකමේ නිගමනය ලියන්න.
III) ස්කන්ධය මනින ඒකකය ලියන්න.

(10) අප අවට ඇති දෑ පහත ආකාරයට වර්ග කළ හැකිය. හිස්තැන් පුරවන්න.

අප අවට ඇති දේ →
- ජීවීන් → ශාක, b) ......................, c) ......................
- d) .................... →
  - පදාර්ථය → a) ......................, b) ......................, c) ......................
  - e) .........................

**නාලන්දා විද්‍යාලය - කොළඹ 10**

**ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය**

| 6 ශ්‍රේණිය | විද්‍යාව | ඒකකය: 3 – ජලය ස්වභාවික සම්පතක් ලෙස |
|---|---|---|

(1) ජලය පවතින ආකාර ලෙස වර්ග කරන ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර වනුයේ,

1) වර්ෂණය, මතුපිට ජලය, භූගත ජලය
2) මිරිදිය, කිවුල් දිය, වර්ෂාව
3) මතුපිට ජලය, භූගත ජලය, මිරිදිය
4) භූගත ජලය, මතුපිට ජලය, මිරිදිය

(2) මිනිසාට ප්‍රයෝජනයට ගත හැකි ජල ප්‍රමාණය,

1) 0.01% 2) 2.58% 3) 97.4% 4) 5%

(3) ජලයේ ලවනතාව යනු,

1) ජලයේ අඩංගු ලුණු ප්‍රමාණයයි.
2) ජලයේ දියවී ඇති ලවණ ප්‍රමාණයයි.
3) දියවී ඇති අපද්‍රව්‍ය ප්‍රමාණයයි.
4) ජලයේ දියවී ඇති ක්ලෝරයිඩ් ප්‍රමාණයයි.

(4) ජලය ඝන අවස්ථාවේ පවතින අවස්ථාවක් නොවන්නේ,


1) අයිස් 2) ග්ලැසියර් 3) හිම 4) හුමාලය

(5) ඝණ, ද්‍රව, වායු සියල්ලම දැකිය හැකි වන්නේ,

1) මැටි 2) පෙට්‍රල් 3) ජලය 4) ගල් අඟුරු


(6) වායු ගෝලයේ ජල වාෂ්ප පවතී දැයි පරීක්ෂා කිරීමට සිදු කල ක්‍රියාකාරකමක නම් කල රූපසටහනක් ඇඳ දක්වන්න.

(7)



(8) පහත පරීක්ෂණය සිදු කරන්නේ කුමන සංසිද්ධි / සංසිද්ධියක් ආදර්ශනයට ද?

එම රූප සටහනේ a, b, c, d, e නම් කරන්න.





(9) රූපයේ දැක්වෙන පරිදි A හා B ද්‍රාවණ 2 න් සම පරිමා ගෙන ජලය වාෂ්ප වීමට සලස්වා එම තැටිවල ස්කන්ධය ලබා ගන්නා ලදී.

A කම්බියේ ස්කන්ධය = 2 mg

B කම්බියේ ස්කන්ධය = 3 mg

ලවණතාව වැඩි කුමන ද්‍රාවණයේ ද?




(10) i) ජීවීන්ට ජීවය පවත්වා ගැනීමට ජලය වැදගත් වන ආකාර 2 ක් ලියන්න.

ii) ජල දූෂණය යන්න අර්ථ දක්වන්න.

iii) ජල දූෂණය සිදුවන ආකාර 3 ක් ලියන්න.

| 6 ශ්‍රේණිය | විද්‍යාව | කාලය : පැය 1 |
|---|---|---|

## 4 වන ඒකකය - ශක්තිය

(1) කාර්යයක් කිරීමේ හැකියාව,
1) බලය වේ. 2) ප්‍රභාසංස්ලේෂණය වේ.
3) ශක්තිය වේ. 4) ස්වසනය වේ.

(2) ජීවීන්ට ශක්තිය ලැබෙන්නේ,
1) ශාක මඟිනි 2) චන්ද්‍රයා මඟිනි 3) දළීර මඟිනි 4) සූර්යයා මඟිනි

(3) රෙදි මැදීමට යොදා ගත හැක්කේ කුමක් ද?
1) සූර්යයා 2) සූර්ය පැනල
3) ජල විදුලිය 4) පොල් කටු අඟුරු ස්ත්‍රික්කය

(4) සූර්යයාගේ තාප ශක්තිය යොදා ගෙන,
1) ප්‍රභාසංස්ලේෂණය සිදුවේ. 2) සූර්ය ජලතාපක නිර්මාණය කරයි.
3) සූර්ය පැනල නිර්මාණය කරයි. 4) කුඩු ලිප නිර්මාණය කරයි.

(5) ශ්‍රී ලංකාවේ සුළං බලාගාර දක්නට ලැබෙන ස්ථානයකි,
1) හම්බන්තොට 2) අනුරාධපුර 3) කොළඹ 4) කතරගම

(6) වඩදිය බාදිය තත්වයන් ඇතිවන්නේ,
1) උදම් රළ නිසා 2) ගලා යන ජලය නිසා
3) මුහුදු රළ නිසා 4) පොකුණු ජලය නිසා

(7) වාත ධාරාවක් යොදා ගනිමින් තල බඹර කරකවන්නේ,
1) උදම් රළ 2) මුහුදු රළ
3) ගලා යන ජලය 4) වැව් වල දිය රැළි

(8) හු තාපය සහ න්‍යෂ්ඨික බලය මඟින් කාර්යය කිරීමේදී තල බඹර කරකවන්නේ,
1) හුමාලය 2) ගලා යන ජලය 3) සුළඟ 4) පරමාණු


(9) ඉක්මණින් අවසන් වන ශක්ති ප්‍රභවය කුමක් ද?
1) ජෛව ස්කන්ධ 2) සුළඟ
3) ෆොසිල ඉන්ධන 4) ජලය

(10) ෆොසිල ඉන්ධන ඝන, ද්‍රව, වායු පදාර්ථ ලෙස දක්නට ලැබෙන්නේ,
1) පෙට්‍රල්, ගල් අඟුරු, පෙට්‍රෝලියම් වායු 2) ගල් අඟුරු, පෙට්‍රල්, පෙට්‍රෝලියම් වායු
3) ඩීසල්, L. P. ගෑස්, ගල් අඟුරු 4) L. P. ගෑස්, ගල් අඟුරු, පෙට්‍රල්

**(1) පහත දැක්වෙන වගන්ති නිවැරදිනම් (✓) වැරදිනම් (×) යොදන්න.**


1) සූර්ය්‍ය තාපක උදුනක ඇතුලත පෘෂ්ඨය ආලෝකය හොඳින් පරාවර්තනය කල යුතුය.( )
2) ශක්ති සපයන දේ ශක්ති ප්‍රභව ලෙස හැඳින්වේ. ( )
3) ෆොසිල ඉන්ධන වලට වඩා වැඩි ශක්තියක් ජෛව ස්කන්ධ තුල ගබඩා වී ඇත. ( )
4) සුළං බලාගාර වල සුළං ශක්තිය යොදා ගෙන තල බඹර කරකැවේ. ( )
5) භූ තාපය සහ න්‍යෂ්ටි ශකිතිය මගින් කාර්‍යයන් ඉටුකර ගැනීමේ දී හුමාලය යොදා නොගනී. ( )
6) න්‍යෂ්ඨික බලය යොදා ගැනීමේ දී වාසි මෙන්ම අවාසිදායක ප්‍රතිඵල ද ඇති වේ. ( )
7) උස ස්ථානයක ගබඩා වී ඇති ජලයේ ................ වැඩි ශක්තියක් ගබඩා වී නොමැත. ( )
8) ෆොසිල ඉන්ධන ඝන, ද්‍රව, වායු යන පදාර්ථ තුනෙන්ම දක්නට ලැබේ. ( )
9) ජෛව ඉන්ධන, ෆොසිල ඉන්ධන තුල ඇත්තේ ශාක හා සතුන් තුල ගබඩා වී ඇති ශක්තියයි. ( )
10) සූර්ය්‍ය පැනල තුලදී ආලෝක ශක්තිය විද්‍යුත් ශක්ති බවට පරිවර්තනය කල නොහැක. ( )

(2)




1) A, B, C, D කොටස් නම් කරන්න.
2) C උපකරණය ක්‍රියා කරවීමට A නැමැති ද්‍රව්‍ය ලබා ගැනීමට යොදා ගත හැකි වෙනත් ශක්ති ප්‍රභවයක් නම් කරන්න.
3) එම ශක්ති ප්‍රභවයේ ඇති වාසියක් හා අවාසියක් ලියා දක්වන්න.
4) රූප සටහනේ දක්වා ඇත්තේ කුමන ශක්ති ප්‍රභවයක් පිළිබඳව ද?
5) මෙම ශක්ති ප්‍රභව 2 කට අමතරව වෙනත් ශක්ති ප්‍රභව 2 ක් නම් කරන්න.


(3) 1) පහත දැක්වෙන ගැලීම් සටහන් සුදුසු වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.



(භූ තාපය, ගලායන ජලය, වාත ධාරාව, සුළං ශක්තිය, තල බඹර, තාප ශක්තිය, විදුලි උත්පාදක යන්ත්‍රය)

2) ඉහත ශක්ති ප්‍රභව වලට අමතරව වෙනත් ශක්ති ප්‍රභව 2 ක් ලියන්න.
3) උදම් රළින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට තිබිය යුතු සාධකය කුමක් ද?
4) ඉහත ගැලීම් සටහනේ දැක්වෙන ශක්ති ප්‍රභව වලින් ලංකාවට ගැලපෙන ශක්ති ප්‍රවභය කුමක්ද?
5) B ශක්ති ප්‍රභවය මඟින් විදුලිය නිපදවන ක්‍රියාවලියේ දී C උපකරණය යොදා නොගැනීමට හේතුව කුමක් ද?

(4)



1) A, B, C අවස්ථා සඳහා සූර්‍යයාගේ කුමන ශක්ති ආකාරයක් යොදා ගනීද?
   A –
   B –
   C –
2) A නැමැති උපකරණයෙන් ඇති ප්‍රයෝජන 2 ක් ලියන්න.
3) B මත ශක්තිය ගබඩා වන ක්‍රියාවලිය කුමක් ද?
4) C උපකරණය නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 2 ක් ලියන්න.
5) A නැමැති උපකරණය තුළ සිදුවන ශක්ති පරිවර්තනය කුමක්ද?

(5) ගැලපෙන වචනය තෝරා හිස්තැන් පුරවන්න.

1) ජෛව ස්කන්ධ භාවිත කරමින් ............................................ නමින් ඉන්ධනයක් නිපදවිය හැක.
2) ජල විදුලි බලාගාර වල ............................................ නිපදවන්නේ ගලා යන ජලය මඟිනි.
3) චන්ද්‍රිකා සඳහා ............................................ යොදා ගනී.
4) කාර්යය කිරීමේ හැකියාව ............................................ වේ.
5) සූර්‍යයාගේ ............................................ යොදාගෙන සූර්ය ජල තාපකය ක්‍රියාත්මක කරයි.

(ශක්තිය, තාප ශක්තිය, විදුලි ශක්තිය, සූර්යය පැනල, සූර්යය ජල තාපක, ජීව වායුව)

NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | විද්‍යාව | ඒකකය: 5 - |
|---|---|---|

(1) දීප්ත වස්තුවකි.

1) චන්ද්‍රයා  2) සූර්යයා  3) මල්  4) ග්‍රහලෝක

(2) පාරභාෂක ද්‍රව්‍යයක් වන්නේ,

1) ඇලුමිනියම් කොල  2) තෙල් කඩදාසි
3) ලී කැබැල්ල  4) කාඩ්බෝඩ්

(3) පාරදෘශ්‍ය ද්‍රව්‍යයකි.

1) සව්කොල  2) ඇලුමිනියම් කොල  3) වීදුරු  4) මල් වීදුරු


(4) පාරාන්ධ ද්‍රව්‍යයකි.

1) භූමිතෙල්  2) පැණි  3) ජලය  4) මඩ වතුර

(5) පාරදෘශ්‍ය ද්‍රවයකි.

1) භූමිතෙල්  2) පැණි බීම  3) මඩ වතුර  4) ජලය

(6) මෙම පරීක්ෂණයෙන් ඔප්පු කිරීමට බලාපොරොත්තු වන්නේ පෙනීම සඳහා සම්පූර්ණ විය යුතු කුමන සාධකයේ බලපෑම ද,




(7) වැරදි ප්‍රකාශය තෝරන්න.

1) ප්‍රභාසංස්ලේෂණය සඳහා ආලෝකය අවශ්‍ය වේ.
2) ලංකාවේ ප්‍රධාන නගර හරහා දුරකථන සම්බන්ධතා ජාලයක් සකස් කොට ඇත්තේ ද ප්‍රකාශ තන්තු මගිනි.
3) ඇසේ සුද ඉවත් කිරීමට ලේසර් කිරණ යොදා ගනී.
4) සංඥා සඳහා ආලෝකය යොදා ගත නොහැක.

(8) තමා විසින්ම ආලෝකය නිකුත් නො නොකරන ජීවියෙක් නොවන්නේ,

1) රෑ බදුල්ලා  2) කලාමැරියා  3) හතු  4) ගැඩවිලා

(9) ප්‍රකාශ තන්තු තාක්ෂණය මගින් ශරීරය තුළ සිදු කෙරෙන වෛද්‍ය පරීක්ෂණ කටයුතුවලදීත් ශරීර අභ්‍යන්තරය නිරීක්ෂණය කිරීමට යොදා ගන්නා උපකරණය නම් කුමක් ද?

1) එන්ඩස්කෝප්  2) පරීක්ෂය  3) කාචය  4) දර්පණය

(10) ආලෝක සංඥාවක් භාවිතා කරන අවස්ථාවකි.

1) දිවීමේ තරගයකදී
2) පිහිනීමේ තරගයකදී
3) ප්‍රදීපාගාරය
4) තොරණ් වල

(1) හිස්තැන් පුරවන්න.

1) පෙනීම සඳහා ............................................. සහ ............................................. සාධක දෙකම අවශ්‍ය වේ.

2) ශාකවල ආහාර නිෂ්පාදනයට ............................................. අවශ්‍ය වේ.

3) ආලෝකය තමා විසින්ම නිකුත් කරන වස්තු ............................................. ලෙස හැඳන්වේ.

4) ආලෝකය ............................................. මාර්ගයක ගමන් කරයි.

5) තෙල් කඩදාසි ............................................. ද්‍රව්‍ය වේ.

6) පොලිතින් කොළ ............................................. ද්‍රව්‍ය වේ.

7) ............................................. දීප්ත වස්තුවකි.

8) ............................................. වෛද්‍යපරීක්ෂණවල ශරීර අභ්‍යන්තරය නිරීක්ෂණයට යොදාගනී.

9) ............................................. හරහා ආලෝකය මගින් පණිවිඩ සම්ප්‍රේෂණය කෙරේ.

10) ආලෝක ............................................. රාශියක් එකතු වීමෙන් සෑදේ.

a) ප්‍රකාශ තන්තු
b) එන්ඩස්කෝප්
c) පාරදෘශ්‍ය
d) පාරභාෂක
f) පාරාන්ධ
f) දීප්ත
g) ඇස
h) ආලෝකය
i) සරල
j) රේඛීය
k) කලා මැදිරියා
l) කිරණ
m) ආලෝකය

(2) i) පාරදෘශ්‍ය ද්‍රව්‍ය යනු කුමක් ද?
ii) පාරභාශක ද්‍රව්‍ය යනු කුමක් ද?
iii) පාරාන්ධ ද්‍රව්‍ය යනු කුමක් ද?
iv) ආලෝකයේ සරල රේඛීය තමන් කරන බවට පත් පරීක්ෂණයක් ලියන්න.
(ඇටවුමක් භාවිතා කරන්න.)

(3) i) පෙනීම සඳහා අවශ්‍ය සාධක මොනවාද?
ii) දීප්ත වස්තු නම් කරන්න.
iii) අදීප්ත් වස්තු නම් කරන්න.

(4) පහත ද්‍රව්‍ය කාණ්ඩ තුනකට වෙන් කර වගුවට ඇතුලත් කරන්න.

| පාරදෘශ්‍ය | පාරභාෂක | පාරාන්ධ |
|---|---|---|
| | | |
| | | |
| | | |

පොලිතීන්, කාඩ්බෝඩ්, තෙල් කඩදාසී, වීදුරු, සව් කඩදාසි, කළු කඩදාසි, මල් වීදුරු, ලී කෑල්ලක්

| 6 ශ්‍රේණිය | විද්‍යාව | කාලය - පැය 1 |
|---|---|---|

## ඒකකය 6 - ශබ්දය හා ඇසීම

01) ධ්වනිය උපදවන වස්තු,
1) ශක්ති ප්‍රභව 2) ධ්වනි ප්‍රභව
3) ආලෝක ප්‍රභව 4) තාප ප්‍රභව

02) ශබ්දය ඇතිවීමේදී දෙදරීමක් දනෙන්නේ,
1) රබානක කඩදාසි කැබලි උඩ විසිවීම මඟිනි
2) බල්ලෙකුගේ බිරුම් හඬක් මඟිනි
3) සයිලෆොනයක් නද දීම
4) බයිසිකල් සීනුව නාදවන විට ඇඟිල්ල තැබීම

03) නළාවක ශබ්දය නිපදවෙන ආකාරයට ශබ්දය නිපදවෙයි. භාණ්ඩයක් නම් කරන්න.
1) සර්පිනාව 2) තම්මැට්ටම
3) සයිලෆෝනය 4) වයලීනය

04) රිද්මයානුකුල නොවන ශබ්ද,
1) සංගීතය 2) ඝෝෂාව 3) කුංචනාදය 4) උඩුබිරුම

05) සිතාරයේ ශබ්දය උපදින ආකාරයට ශබ්දය උපදින භාණ්ඩයකි,
1) සර්පිනාව 2) හොරණෑව 3) වයලීනය 4) තබ්ලාව

06) ශබ්දය කන වෙත යොමු කිරීමට,
1) කන උදව්වේ 2) කන් බෙරය උදව් වේ.
3) කන්පෙති උදව් වේ. 4) බාහිර ශබ්ද උදව් වේ.

07) අවට පරිසරයෙන් ඇසෙන ස්වභාවික ශබ්දයකි,
1) මෝටර් රථ හඬ 2) බෙර වාදයක්
3) පාසල් සීනු හඬ 4) දිය ඇල්ලක් ශබ්දය

08) හඬ නිපදවෙන සෑම අවස්ථාවක දීම සිදු නොවන්නේ,
1) කම්පනයකි 2) ඔබ මොබ චලනයකි
3) දෙදරීමකි 4) ගලායාමකි

09) ඔබ මොබ චලිතය නිරීක්ෂණය කිරිමට යොදාගත හැකි වස්තුවකි,
1) බටනලාව 2) සයිලෆෝනය
3) රබාන 4) සර්පිනාව

10) රිද්මයකට අනුව ගැයෙන වැයෙන ශබ්ද,
1) සංගීතයයි 2) මෝටර් රථ වල හඬ වේ.
3) ඝෝෂාවයි 4) යන්ත්‍ර සූත්‍ර හඬ වේ.

## රචනා ප්‍රශ්න

01) **ඔබට පන්ති කාමරයේ පහත දැක්වෙන උපකරණ නිර්මාණය කිරිමට උපදෙස් ලැබුණි.**

**ටින් වීණාව, ටකය, පෑන් බට නලාව, බැලුන් පටල බෙරය**

i) ටින් වීණාවට සමානව ශබ්දය උපදවන සංගීත භාණ්ඩයක් නම් කරන්න.

ii) එම සංගීත භාණ්ඩයේ ශබ්දය උපදවන්නේ කෙසේද?

iii) පෑන් බට නලාවේ වැඩිම ශබ්ද තීව්‍රතාවයක් ඇති වන්නේ කුමන බටයෙන්ද?

iv) මෙම පෑන් බට නලාවට සමාන ලෙස ශබ්දය නිපදවෙන සංගීත භාණ්ඩ 2ක් නම් කරන්න.

v) බැලුන් පටල බෙරය යොදාගෙන කම්පනය හෙවත් ඔබ මොබ චලනය වීම නිරික්ෂණය කරන්නේ කෙසේද?

02) **ගැළපෙන පද යා කරන්න.**

| | | |
|---|---|---|
| i) | ධ්වනි උපදවන වස්තු | දෙදරීම |
| ii) | අවිධිමත් ශබ්ද (රිද්මයානුකුල) | සිතාරය |
| iii) | පටල කම්පනයේ ශබ්දය නිපදවයි | තාලම්පට |
| iv) | කෘතිමව ඇතිවන ශබ්දයකි | කම්පනය |
| v) | තන්තු කම්පනයෙන් ශබ්දය නිපදවයි | තම්මැට්ටම |
| vi) | වාත කඳක් කම්පනය වන උපකරණයකි | ධ්වනිප්‍රභව |
| vii) | බයිසිකල් සීනුවක් ස්පර්ශ කිරීමෙන් දැනෙන්නේ | වාහන හඬ |
| viii) | බයිසිකල් සීනුවක් ස්පර්ශ කිරීමෙන් දැනෙන්නේ | වාහන හඬ |
| ix) | ලෝහ පෘෂ්ඨය තට්ටු කිරීමෙන් ශබ්දය ඇතිවේ | සංගීතය |
| x) | ලෝහ තහඩුවල දිග අනුව ශබ්දය වෙනස් වේ | හොරණෑව |

03) **පහත දැක්වෙන සංගීත උපකරණය පහත දැක්වෙන වගුවට වර්ග කරන්න.**

වයලීනය, තම්මැට්ටම, තාලම්පට, හොරණෑව, බටනලාව, සර්පිනාව, සිතාරය, ගැටබෙරය

| ලෝහ පෘෂ්ඨයට තට්ටු කිරීම | පටල කම්පනය | තත් කම්පනය | වාතය කම්පනය |
|---|---|---|---|
| | | | |

| 6 ශ්‍රේණිය | විද්‍යාව | කාලය - පැය 1 |
|---|---|---|

## 7 වන ඒකකය - චුම්බක

01) චුම්භකයකට ආකර්ෂණය වන ද්‍රව්‍යයක් වන්නේ,

1) පිත්තල ඇණ 2) පැන්සල් කුර
3) යකඩ ඇණ 4) තඹ කැබලි


02) චුම්භක භාවිතා කරන උපකරණයකි,

1) පෑන 2) කවකටුව 3) කතුර 4) මාලිමාව

03) වතුර වීදුරුවකට වැටුණු අල්පෙනිත්තක් ඉවතට ගැනීමට යොදා ගත හැක්කේ,

1) ඇඟිල්ල 2) චුම්භක 3) කවකටුව 4) තඹ තහඩුවක්


04)




රූපයේ දක්වෙන පරීක්ෂණය මඟින් සොයා බලන්නේ,

1) චුම්භක වල බර වැඩිම ස්ථානය
2) චුම්භක ආකර්ශන බල වැඩි ස්ථාන
3) චුම්භක වල දිග හඳුනාගැනීම
4) චුම්භක වර්ග හඳුනා ගැනීම

5) මෙම රූපයෙන් දක්වෙන්නේ,








1) දණ්ඩ චුම්භක
2) පෙති චුම්භක
3) බූරප චුම්භක
4) ඔ හැඩැති චුම්බක


06) චුම්භක පිළිබඳව අසත්‍ය වගන්තිය තෝරන්න.


1) සෑම ලෝහයක්ම චුම්භකයට ආකර්ශනය වේ.
2) චුම්භක වල ධ්‍රැව 2 ක් ඇත.
3) චුම්භක වල ආකර්ශය බලය චුම්භක දෙකෙළවර පවතී.
4) චුම්භක සෑම විටම නිශ්චල වන්නේ උතුරු දකුණු දිශාව ඔස්සේය.

07) වැඩිම ප්‍රබලතාවය ඇති චුම්භකය වන්නේ,

1) 
2) 
3) 
4) 

08) 1) 

2) 

3) 


නිවැරදි වගන්තිය තෝරන්න.

1) 1, 2 රූපසටහනෙහි නිවැරදිය.
2) 2, 3 රූප සටහන් නිවැරදි ය.
3) 1. 3 රූප සටහන් නිවැරදිය.
4) රූප සටහන් තුනම වැරදිය.

09) පෙති චුම්භක වල ධ්‍රැව පිහිටන්නේ,

1) පෙති චුම්භකයක දෙකෙළවරය.
2) පෙති චුම්භකයක දෙපැත්තේය.
3) චුම්භක ධ්‍රැව එක් පැත්තකය.
4) මැද කොටසේය.

10) අශ්වලාඩමක හැඩය ඇත්තේ,

1) දණ්ඩ චුම්භක
2) වලයාකාර චුම්භක
3) බූරප චුම්භක
4) සූ හැඩැති චුම්භක


## <u>රචනා ප්‍රශ්න - 03</u>

01) **සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(මැග්නඩූර් ආකර්ශනය වේ, උත්තර ධ්‍රැවයයි, චුම්භක ධ්‍රැව, දක්ෂිණ ධ්‍රැවය, පජාතීය ධ්‍රැව)

1) චුම්භක N අකුරින් දක්වන්නේ, ....................................
2) යකඩ අඩංගු ද්‍රව්‍ය පහසුවෙන චුම්භකයට ....................................
3) චුම්භකයක් .................................... අන්තර්ගත වේ.
4) .................................... දෙපැත්තේ චුම්භක ධ්‍රැව පිහිටා ඇත.
5) සමාන ධ්‍රැව .................................... ලෙස හැඳින්වේ.

02) **A, B, C නමැති ද්‍රව්‍ය 3 ක් දණ්ඩ චුම්භකයකට ලං කරන ලදි. C එම ද්‍රව්‍ය හඳුනාගත නොහැකි කෙල දවටා ඇත.**

**1.** 


කිසිවක් සිදු නොවේ.

1) එක් එක් වස්තුව හඳුනාගන්න.

(ලබා දී ඇති වස්තූන් වන්නේ, යකඩ ඇණයක්, පිත්තල ඇණයක්, දණ්ඩ චුම්බකයක්)

A - ..........................................................................................................

B - ..........................................................................................................

C - ..........................................................................................................

2) යකඩ ඇණය සහ පිත්තල ඇණය අතර ඇති සමාන ගුණයක් ලියන්න. (ලෝහ ගුණයක් ඇසුරින්)

3) දණ්ඩ චුම්භකයක් චුම්භක බල පැතිර ඇති ප්‍රදේශය හඳුන්වන නම කුමක්ද?

4) විකර්ෂණය වන්නේ කුමන ධ්‍රැව ද? ආකර්ශනය වන්නේ කුමන ධ්‍රැවද?

**03) පහත සඳහන් වගන්ති නිවැරදි නම් (✔) ලකුමුතු වැරදි නම් වැරදි ලකුණද ලියන්න.**

1) ඇලුමිනියම් චුම්භකයට ආකර්ශනය වේ. ( )

2) චුම්භක බල අඩුවෙන්ම ඇත්තේ චුම්භක ධ්‍රැව වලය. ( )

3) මාලිමාව මඟින් චුම්භකයක උතුරු දිශාව සොයාගත හැක. ( )

4) වෙනත් චුම්භක ධ්‍රැව සජාතිය ධ්‍රැව ලෙස හැඳින්වේ. ( )

5) CFC බල්බයක චුම්භකයක් අඩංගු වේ. ( )

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | විද්‍යාව | ඒකකය: 8 - සුව පහසු දිවියක් සඳහා විදුලිය |
|---|---|---|


(1) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ලෙස විදුලිය නිපදවනු ලබන්නේ,
1) ජලයේ ශක්තිය යොදාගෙනය. 2) ගල් අඟුරු වල ශක්තිය යොදාගෙනය.
3) න්‍යෂ්ටික ශක්තිය යොදාගෙනය. 4) සුළගේ ශක්තිය යොදාගෙනය.



(2) ශ්‍රී ලංකාවේ සුළං විදුලි බලාගාරයක් පිහිටා ඇත්තේ,
1) කොත්මලේය. 2) හම්බන්තොටය.
3) නොරොච්චෝලේය. 4) කැලණිතිස්සය.

(3) ජල විදුලි බලය නිෂ්පාදනය කළ හැකි බව ශ්‍රී ලංකාවට මුලින්ම හඳුන්වා දුන්නේ,
1) විමල සුරේන්ද්‍ර මහතා ය. 2) රොබට් නොක්ස් ය.
3) හම්ප්‍රිඩේවි මහතා ය. 4) රොබට් විට්ටේකර් ය.


(4) සරල කෝෂය නිර්මාණයට අවශ්‍ය ලෝහ වර්ග 2 නම්,
1) කොපර්, සින්ක් ය. 2) යකඩ, ඇලුමිනියම් ය.
3) යකඩ, සිල්වර් ය. 4) කොපර්, යකඩ ය.


(5) ඩයෝඩයේ සම්මත සංකේතය,

1)  2) 


3)  4) 


(6) ආලෝක විමෝචක ඩයෝඩයේ සංකේතය,

1)  2) 

3)  4) 

(7) ආලෝක සංවේදී ප්‍රතිරෝධකයේ සංකේතය,

1)  2) 

3)  4) 

(8) විද්‍යුත් සන්නායකයක් නොවන්නේ,
1) තඹ 2) මයිකා 3) ඇලුමිනියම් 4) රිදී


(9) ප්‍රතිරෝධය මනින ඒකකය,
1) ඕම් ය. 2) ඇම්පියර් ය. 3) වෝල්ට් ය. 4) කූලෝම්

(10) ඩයෝඩයේ ප්‍රධාන කාර්යය වන්නේ,
1) විදුලි ධාරාව අඩු කිරීමය.
2) පරිපථයේ ප්‍රතිරෝධය වැඩි කිරීමයි.
3) විදුලි ධාරාව එක් දිශාවකට පමණක් ගැලීමට සැලැස්වීමයි.
4) විදුලි ධාරාව මනින උපකරණයයි.

- **යා කරන්න.**


(1)
a) විදුලිය ගමන් කරන ද්‍රව්‍ය — ප්‍රතිරෝධය
b) විදුලිය නොගලන ද්‍රව්‍ය — ඇමීටරය
c) ඉතා කුඩා විදුලි ධාරා මනින්නේ — මිලි ඇමීටරය
d) විදුලි ධාරාව මනින උපකරණයකි — පරිවාරක
e) පරිපථයක විද්‍යුත් ධාරව ගමන් කිරීමට ඇති වන බාධාව — සන්නායක


(2) විද්‍යාගාරයේ දී නිර්මාණය කළ සරල කෝෂයක රූප සටහනක් පහත දක්වේ.



i) එහි ස්විචය වැසූ විට දක්නට ලැබෙන නිරීක්ෂණයක් ලියන්න.
ii) සරල කෝෂයේ දුර්වලතාවක් ලියන්න.
iii) රසායනික කෝෂ බෙදිය හැකි ආකාර 2 නම් කරන්න.
iv) ඒවාට උදාහරණ ලියන්න.


(3)
i) විදුලිය නිපදවිය හැකි බහුලව භාවිතා කරන ක්‍රම 3 ලියන්න.
ii) A හා B රූපසටහනකින් දක්වෙන උපකරණ හඳුනා ගන්න.





iii) වියළි කෝෂයක්, ස්විචයක්, ඇමීටරයක්, බල්බයක්, සම්බන්ධ කරන ආකාරය පරිපථ රූප සටහනකින් ඇඳ දක්වන්න.

(4)
i) ආලෝක සංවේදී ප්‍රතිරෝධකය මතට ආලෝකය වැටුන විට පරිපථයේ බල්බයේ දීප්තියට කුමක් සිදුවේද?



ii) ඔබ දන්නා වෙනත් ප්‍රතිරෝධක වර්ග 2 ක් ලියන්න.

iii)



ඉහත පරිපථයේ බල්බ දෙක සම්බන්ධ කර ඇති ආකාරය හැඳින්වෙන නම කුමක් ද?

(5)
i) ඔබට ගැල්වනෝමීටරයක්, යෝගට් හැඳි, මෝටරයක්, කිරල ඇබයක් සපයා ඇත්නම් එය සම්බන්ධ කර කුඩා විදුලි බලාගාරයක ආකෘතියක් ඇඳ දක්වන්න.
ii) විදුලි ශක්තිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීමට ඔබට දායක විය හැකි ආකාර 3 ක් ලියන්න.
iii) විදුලි අනතුරු වලක්වා ගැනීමට කල හැකි දේවල් 3 ක් ලියන්න.

(1) මිනිස් සිරුරේ සාමාන්‍ය උෂ්ණත්වය,

1) 37 °C  2) 98.4 °C  3) 20 °C  4) 30 °C

(2) උෂ්ණත්වමානයක අඩංගු කල හැකි ද්‍රව වන්නේ,

1) මධ්‍යසාර පමණි  2) රසදිය පමණි
3) රසදිය හෝ මධ්‍යසාර වේ  4) ඕනෑම ද්‍රවයකි

(3) යකඩ කැබැල්ලක් තාපය සපයමින් රත් කරන විට යකඩ කැබැල්ලේ වර්ණ විපර්යාසය,

1) කහ → රතු → තැඹිලි  2) රතු → තැඹිලි → රතු
3) කහ → තැඹිලි → අළු  4) රතු → තැඹිලි → දුඹුරු

(4) නිවැරදිව අවස්ථා විපර්යාසය දක්වෙන්නේ,

1) ජලය $\xrightarrow{\text{තාපය}}$ අයිස් $\xrightarrow{\text{තාපය}}$ හුමාලය

2) හුමාලය $\xrightarrow{\text{තාපය}}$ අයිස් $\xrightarrow{\text{තාපය}}$ ජලය

3) ජලය $\xleftarrow{\text{තාපය}}$ අයිස් $\xleftarrow{\text{තාපය}}$ හුමාලය

4) අයිස් $\xrightarrow{\text{තාපය}}$ ජලය $\xrightarrow{\text{තාපය}}$ හුමාලය

(5) සූර්යයා හැරුණු විට තාපය ලබා දෙන වෙනත් ප්‍රභවයක් වන්නේ,

1) ගල් අඟුරු  2) දර  3) භූමිතෙල්  4) ඉහත සියල්ලම

(6) නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1) පරිසරයේ උෂ්ණත්වය වෙනස් වන විට අප ශරීරය තුල උෂ්ණත්වය ද වෙනස් වේ.
2) සර්පයින් ගෙම්බන්ගේ ද පරිසර උෂ්ණත්වය අනුව දේහ උෂ්ණත්වය වෙනස් නොවේ.
3) කුරුල්ලන්ගේ ද පරිසර උෂ්ණත්වය අනුව දේහ උෂ්ණත්වය වෙනස් වේ.
4) කෘමීන්ගේ පරිසර උෂ්ණත්වය අනුව දේහ උෂ්ණත්වය වෙනස් වේ.

(7) අපගේ ප්‍රධාන තාප ප්‍රභවය,

1) දර  2) ඉන්ධන  3) භූමිතෙල්  4) සූර්යයා

(8) තාපය හා සම්බන්ධ සංසිද්ධියක් නොවන්නේ,

1) දිවා කාලයේ දී පරිසරය උණුසුම් වේ.
2) අයිස් කැටයක් ශීතකරණයෙන් පිටතට ගත් විට ජලය බවට පත් වෙයි.
3) වියළි කෝෂ 2 ක් බල්බයකට සම්බන්ධ කල විට බල්බය දැල්වේ.
4) කරත්ත රෝදයකට පට්ටම් සවි කිරීමට පෙර ගිනිගොඩක තබා එම පට්ටම් රත් කරනු ලබයි.

(9) වැරදි ප්‍රකාශය තෝරන්න.

1) තාපය ලබා දුන් විට ද්‍රව්‍ය උණුසුම් වේ.
2) තාපය ඉවත්ව ගිය විට ද්‍රව්‍ය සිසිල් වේ.
3) උණුසුමේ ප්‍රමාණය මනින්නේ වෛද්‍ය උෂ්ණත්ව මානයෙනි.
4) උෂ්ණත්වය යනු ද්‍රව්‍යයක උණුසුමේ ප්‍රමාණයයි.

(10) කාමර උෂ්ණත්වයේ දී ද්‍රවයයක් ලෙස පවතින ලෝහය,

1) රසදිය 2) ඊයම් 3) රිදී 4) කොපර්


## II කොටස


(11) නිවැරදි ප්‍රකාශ ඉදිරියෙන් (✓) ලකුණ ද, වැරදි ප්‍රකාශය ඉදිරියෙන් (×) ලකුණ ද යොදන්න.

1) තාපය ලබා ගැනීමට භූමිතෙල් හා ස්වභාවික වායු යොදා ගත හැකිය. ( )
2) සමහර සතුන්ගේ සමට යටින් ඝනකම මේද තට්ටු පිහිටා ඇත. ( )
3) විද්‍යුත් ශක්තියෙන් තාපය ලබා ගත නොහැකි ය. ( )
4) තාපය ප්‍රයෝජනවත් වන්නේ ජීවය පවත්වාගැනීමට පමණි. ( )
5) පෘෂ්ඨ දෙකක් එකිනෙක මත ඇතිල්ලීමෙන් තාපය නිපදවිය හැකිය. ( )

(12) ජලයේ උෂ්ණත්වය වෙනස්වන ආකාරය නිරීක්ෂණය කිරීමට සකසන ලද ඇටවුමක් පහත දැක්වේ.


i) A, B, C, D උපකරණ නම් කරන්න.
ii) එහි නිරීක්ෂණයන් ලියන්න.
iii) මෙම ක්‍රියාකාරකමේ අවස්ථා විපර්යාසයක් ලියන්න.




(13) i) මෙම ක්‍රියාකාරකම මගින් ආදර්ශනය කරන්නේ කුමක් ද?

ii) මෙහි දී ලැබෙන නිරීක්ෂණයක් ලියන්න.
iii) මෙම මූලධර්මය භාවිතා කරන විද්‍යාගාර උපකරණය ලියන්න.
iv) රූපයේ දැක්වෙන පරීක්ෂණය කරන්නේ තාපයේ කුමන බලපෑමක් පරීක්ෂා කිරීමට ද?




(14) i) මෙම පරීක්ෂණයේ අරමුණු ලියන්න.

ii) වීදුරු කූර ඇතුලු කරන්නේ කුමන කලාපයට ද?

iii) එහි ඇත්තේ ඉටිවල කුමන අවස්ථාව ද?

iv) කපුරු පෙති හා කොහොල්ලෑ තැටියකට දමා රත් කරන විට ඉක්මනින් ද්‍රව වන්නේ කුමන ද්‍රව්‍ය ද?





(15) i) සූර්ය ජල තාපකයක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය 3ක් ලියන්න.

ii) මෙහි දී ජලය ඇතුලු කරන්නේ A වලින් ද B වලින් ද

iii) තාපන දඟරයක් ඔබට සෑදීමට පැවරී ඇත්නම් එහි ඇටවුමේ ආකෘතියක් ඇඳ පෙන්වන්න. නම් කරන්න.

iv) තාපය නිසා ඇතිවන පරිසර බලපෑම් 2ක් ලියන්න.



**6 ශ්‍රේණිය** | **විද්‍යාව** | **ඒකකය: 10- ආහාර හා බැඳුනු අන්තර් ක්‍රියා**

(1) ආහාර දාමයේ පළමු පුරුක සෑම විටම,
1) නිෂ්පාදකයා ලෙස හැඳින්වේ. 2) පාරිභෝගිකයා ලෙස හැඳින්වේ.
3) විලෝපිකයා ලෙස හැඳින්වේ. 4) පළමු යැපෙන්නා ලෙස හැඳින්වේ.

(2) සත්වයන් හෝ සත්ත්ව ද්‍රව්‍ය හෝ පමණක් ආහාර ලෙස ලබා ගන්නා සතුන්,
1) ශාක භක්ෂක 2) මාංශ භක්ෂක 3) සර්ව භක්ෂක 4) ඉහත කිසිවක් නොවේ.

(3) සර්ව භක්ෂකයෙකි,
1) මීයා 2) මුවා 3) හාවා 4) දළඹුවා

(4) නිවැරදි ආහාර දාමයක් දක්වෙන්නේ,
1) අඹ → බළලා → ලේනා 2) අඹ → වඳුරා → තණකොළ පෙත්තා
3) අඹ → ලේනා → බළලා 4) අඹ → හාවා → සමනලයා

(5) සතුන් ලබා ගන්නා ආහාර මත පදනම්ව සතුන් ප්‍රධාන කාණ්ඩ කීයකට බෙදිය හැකි ද?
1) 4 කට 2) 2 කට 3) 3 කට 4) 5 කට

(6) චීනයේ එකම ආහාර වර්ගයක් අනුභව කරන නිසා වඳවී යන සත්ත්ව විශේෂයකි,
1) මුවා 2) ජිරාෆ් 3) අලියා 4) පැන්ඩා

(7) වැරදි ප්‍රකාශය තෝරන්න.
1) ආහාර දාමයක ඇති සෑම පුරුකක්ම පරිසරයේ සමතුලිත බව පවත්වා ගැනීමට විශාල මෙහෙයක් ඉටු කරයි.
2) ආහාර දාමයක යම් කිසි පුරුකකට අයත් වන ජීවියෙක් විනාශ වුවහොත් හෝ ඉවත් වුවහොත් එය ආහාර දාමයේ අනෙක් පුරුක් වල පැවැත්ම කෙරෙහි බලපායි.
3) එමගින් පුරුක් වල සංඛ්‍යාව වැඩි වේ.
4) සෑම ජීවියෙක්ම පරිසරයේ සමතුලිතතාව පවත්වා ගැනීමට වැදගත් වේ.


(8) ශාක → මුවා → කොටියා
1) පුරුක් 3 ක ආහාර දාමයකි. 2) මුවා ප්‍රාථමික නිෂ්පාදකයාය.
3) පුරුක් 3 ක ආහාර ජාලයකි. 4) පුරුක් 2 ක ආහාර ජාලයකි.

පේර ශාකයක → [a] → [b] → ඇටි කුකුළා

(9) ඉහත ආහාර දාමයේ a ස්ථානයට අදාල ජීවියා,
1) දළඹුවා 2) කටුස්සා 3) කොටියා 4) සමනලයා

(10) ඉහත ආහාර දාමයේ b ස්ථානයට අදාල ජීවියා,
1) දළඹුවා 2) කටුස්සා 3) කොටියා 4) සමනලයා

(11) ආහාර සම්බන්ධතා නිරූපණය වන සටහනක් පහත දැක්වේ.




i) ඉහත දැක්වෙන සටහන හැඳින්වෙන නම කුමක් ද?
ii) ඉහත සටහන උපයෝගී කරගෙන පුරුක් 3 ක ආහාර දාමයක් ලියන්න.
iii) ශාක භක්ෂක සතෙකු නම් කරන්න. (ඉහත සතුන් අතරින්)
iv) ශාක ස්වයංපෝෂීන් යනුවෙන් හැඳින්වෙන්නේ ඇයි?

(12) පහත පද අර්ථ දක්වන්න.

ශාක භක්ෂක –

මාංශ භක්ෂක –

සර්ව භක්ෂක –

ආහාර දාම –

(13) පහත ශාක හා සතුන් යොදාගෙන ආහාර දාමයක් ගොඩ නඟන්න.
i) ජලජ ශාක, මැඩියා, දිය නයා, ජල කුරුමිණියා, ඉස්ගෙඩියා
ii) බත් කුරා, ගෙම්බා, කොටියා, ශාකය, මොනරා, සමනලයා, නයා

(14) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් කරනු ලබන්නේ,
i) කාලගුණික තොරතුරු සෙවීම.
ii) එම තොරතුරු ජනතාව වෙත දැනුම් දීම.
iii) අයහපත් කාලගුණය ඇත්නම් ජනතාව දැනුවත් කිරීම.
iv) ඉහත සියල්ලම.

(15) ආර්ද්‍රතාවය පිළිබඳ නිවැරදි ප්‍රකාශය,
i) එය දිනෙන් දින වෙනස්වේ.
ii) එය වේලාව අනුව වෙනස් වේ.
iii) වායුගෝලයේ අඩංගු ජල වාෂ්ප ප්‍රමාණයයි.
iv) ඉහත සියල්ල නිවැරදිය.

(16) හිස්තැන් පුරවන්න.

1) ශ්‍රී ලංකාවට බලපාන සුළි සුළං බොහෝ විට ...................................... ආශ්‍රිත ඉහල වායුගෝලයේ ය.

2) සුළි සුළඟක් ඇති වන්නේ වායු ගෝලයේ කිසියම් ස්ථානයක ............................................... ඒ අවට අනෙක් ස්ථානවලට වඩා පහළ බැසීමෙනි.

3) වර්ෂාපතනය අඩු වීම නිසා හටගන්නා ................................. පරිච්ඡේදය නියගය ලෙස හැඳින්වේ.

(වායු පීඩනය, වියළි කාල, බෙංගාල බොක්ක)


(1) සුළඟේ වේගය මනින උපකරණය,
1) සුළං දිශා දර්ශකය
2) අනිල මානය
3) ආර්ද්‍රතාමානය
4) වර්ෂාමානය

(2) සුළඟේ දිශාව මනින උපකරණය,
1) සුළං දිශා දර්ශකය
2) අනිල මානය
3) ආර්ද්‍රතාමානය
4) වර්ෂාමානය

(3) වර්ෂාව මනින උපකරණය,
1) සුළං දිශා දර්ශකය
2) අනිල මානය
3) වර්ෂාමානය
4) පීඩන මානය

(4) වර්ෂාපතනය මනින ඒකකය,
1) මිලි මීටර
2) මිලි ලීටර
3) ලීටර
4) මයික්‍රෝ මීටර

(8) ශිෂ්‍යයෙක් විසින් නිර්මාණය කළ ඇටවුමක් පහත දැක්වේ.
i) එම ඇටවුම සඳහා සුදුසු නමක් ලියන්න.
ii) A, B, C, D කොටස් නම් කරන්න.




(9) i) සුළඟේ වේගය සෙවීමට සමීකරණයක් ලියන්න.
ii) සරල වර්ෂාමානයක් සාදන අයුරු රූපසටහනක් ආධාරයෙන් කෙටියෙන් විස්තර කරන්න.

(10) i) කාලගුණය, දේශගුණය යන්න අර්ථ දක්වන්න.
ii) ශ්‍රී ලංකාවේ නායයෑම් සිදුවන ප්‍රදේශ පිළිබඳව තොරතුරු රැස් කරන ආයතනයේ නම කුමක්ද?
iii) නායගිය බිම් නැවත සකස් කරන වෙබ් ලිපිනය ලියන්න.